**සැ. යු.-** (i) 2022.05.13 දින පළ වූ අංක 2280 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2022 වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,281 - 2022 මැයි මස 20 වැනි සිකුරාදා - 2022.05.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 864 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 865 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 868 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 869 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 870 |


**සැ. යු. -** (i) සවීර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 අප්‍රේල් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත 2022 අප්‍රේල් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ජූනි මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මැයි මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු සඳහා ආරාධනය (IFB)

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ හපුතලේ අංගනයට අවු උස කොන්ක්‍රිට් සිල්පර 5,000 සැපයීම සහ ඉහළ දිස්ත්‍රික්කයේ "Check" දුම්රිය මග සඳහා EN 45 E1 පීලිවලට ගැළපෙන අඩු උස කොන්ක්‍රිට් සිප්පර 5,000 හීල්ඔය අංගනයට සැපයීම සඳහා වන ප්‍රසම්පාදනයයි

IFB අංකය : SRS/F.7831

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ හපුතලේ අංගනයට අඩු උස කොන්ක්‍රිට් සිල්පර 5,000 සැපයීම සහ ඉහළ දිස්ත්‍රික්කයේ "Check" දුම්රිය මග සඳහා EN 45 E1 පීලිවලට ගැළපෙන අඩු උස කොන්ක්‍රිට් සිල්පර 5,000 හීල් ඔය අංගනයට සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයන් සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු භාරගනු ලැබේ.

02. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

03. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට මේ පිළිබඳව වැඩිමනත් තොරතුරු පහත සඳහන් ලිපිනයේ දී පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා ලබාගත හැකි අතර, 2022.04.29 වැනි දින සිට 2022.05.23 වැනි දින දක්වා සතියේ දිනයන්හි පෙ.ව . 9.00 සිට ප. ව. 3.00 දක්වා පහත ලිපිනයේ දී ලංසුකරණ ලිපි ලේඛන පරීක්ෂා කර බැලිය හැක.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)
දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
විද්‍යුත් තැපැල : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

04. ලංසුකරු පසුගිය වසර පහක (05) කාලය තුළ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත කොන්ක්‍රිට් සිල්පර් 5,000 ක් හෝ පෙර වැර ගැන්වූ කොන්ක්‍රිට් බාල්ක (Beams) රුපියල් මිලියන 50 කට වැඩි වටිනාකමකට හෝ පෙර වැර ගැන්වූ කොන්ක්‍රිට් කණු රුපියල් මිලියන 500 කට වැඩි වටිනාකමට සපයා තිබිය යුතු අතර එම ඉන්වොයිස් පත්‍රවල පිටපත් ලංසු සමග ඉදිරිපත් කළ යුතු ය.

05. ඉංග්‍රීසි බසින් වන සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් අභිලාෂී ලංසුකරුවන්හට කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාල ලිපිනයට 2022.04.29 වැනි දින සිට 2022.05.23 වැනි දින ප.ව. 3.00 දක්වා ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා රුපියල් විසිහත්දහස් පන්සියයක (රු. 27,500.00) ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව මිලදී ගත හැකි ය.

06. සියලුම ලංසු, ලංසු සුරක්ෂණයක් සමග එවිය යුතු ය. ලංසු සුරක්ෂණය රුපියල් 1,500,000.00 වටිනාකමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවන බැංකුවක් මගින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයක් විය යුතු ය.

07. ලංසු පහත සඳහන් ලිපිනයට 2022.05.24 දින ප. ව. 2.00 ට හෝ ඊට පෙර ගෙනැවිත් භාරදිය යුතු අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගිවන ලෙස ආරාධනා කෙරේ. ප්‍රමාදවී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය :SRS/F. 7831

05-140

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත Base Plates, Fish Plates Coach Screws සහ ඇණ හා මුරිච්චි (Bolts & Nuts) සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F.7823

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) හි සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයට Base Plates,

Fish Plates, Coach Screws (Base තහඩු, ෆිෂ් තහඩු, කෝච් ස්කුරුප්පු) සහ ඇණ හා මුරිච්චි (Bolts & Nuts) පහත දැක්වෙන පරිදි සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය සඳහා ජාත්‍යන්තර තරගකාරි ලංසුකරණ පදනම යටතේ විදේශීය නිෂ්පාදකවරුන්/ සැපයුම්කරුවන් වෙතින්, මුද්‍රා, තබන ලද ලංසු භාරගනු ලැබේ. ලංසුකරුවන්ට ස්වකීය ලංසු, ඍජුව හෝ සිය ඇටර්නි බලය මගින් බලය පවරන ලද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලයලත් ඒජන්ත/නියෝජිතවරයෙකු මගින් ඉදිරිපත් කළ හැකි ය.

| අයිතම අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | Base Plates 90 (A) Lbs | 5,000ක් |
| 02. | Fish Plates 90 (A) Lbs (04 holed) | යුගල් 4,000 ක් |
| 03. | Stud Bolts with Nuts | 5,000 ක් |
| 04. | Coach Screws | 20,000 ක් |
| 05. | Fang Bolts & Nuts - 8 1/2" x 1/4" | 10,000ක් |

02. ශ්‍රී ලංකා රුපියල් 10,250 ක හෝ පහසුවෙන් මාරුකරගත හැකි සමාන මුදල් වර්ගයකින් ආපසු නොගෙවන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2022.06.15 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 තෙක් ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් හෝ ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ හැකි ය.

03. ලංසු භාරගැනීම 2022.06.16 වැනි දා (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් කෙරේ.

04. ලංසුකරුවන් තම ලංසුවල කොටසක් හැටියට රු. 4,00,000.00 හෝ පහසුවෙන් මාරුකරගත හැකි සමාන මුදල් වර්ගයකින් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් සතුව, ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ පදනම මත පහත සඳහන් අයිතම සැපයීම සඳහා පරිශීලක ආයතන/සංවිධාන විසින් නිකුත් කරන ලැබූ කාර්ය සාධන සහතිකයක් ද තිබිය යුතු ය. සියලුම අයිතම එකට එක්ව අගයනු ලබන අතර, එක්වර ප්‍රදානය කරනු ලැබේ.

05. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා, තැබූ ලංසු පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් භාර දිය යුතු ය.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, (ප්‍රසම්පාදන) කාර්යාලය,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10.

07. ලංසුකරණ ලිපිලේඛන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකි ය. වැඩිමනත් විස්තර සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) අමතන්න.

දුරකථන අංක : 94 (11) 2438078/94(11)2436818<br>
ෆැක්ස් අංක : 94(11) 2432044<br>
ඊමේල් : tender2@railway.gov.lk<br>
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය :SRS/F. 7823

05-141

---

# බඩු බාහිරාදිය විකිණීම්

**දැන්වීමයි**

මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2022.05.28

01. මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හිමිකම් නොපාන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2022.05.28** වැනි දින **පෙ. ව. 9.00** ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කිරීමට හැකි වේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගන්නා ලද අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතු ය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

| | *නඩු අංකය* | *වෙන්දේසිය සඳහා නියමිත භාණ්ඩ* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. | - | වැලි | 60 කියුබ් |
| 2. | AR/380/21 | වයිබර් බෝට්ටු | 01 |
| 3. | AR/380/21 | ඔක්සිජන් සිලින්ඩර් | 03 |
| 4. | AR/380/21 | පිහිනුම් සපත්තු | 1 ජෝඩු |
| 5. | AR/380/21 | පිහිනුම් කණ්නාඩි | 01 |
| 6. | AR/380/21 | 20 ලීටර් ලාම්පුතෙල් කෑන් | 01 |
| 7. | AR/380/21 | ජංගම දුරකථන | 1 |

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මුතූර්.

2022 මැයි මස 09 වැනි දින.

05-137

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - ගම්පොළ**

රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මෙම අධිකරණයේ නඩුවලට අදළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ **2022.06.04 වැනි දින පෙ. ව. 9.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ පෙ. ව. 8.30 ට පෙර හිමිකම් තහවුරු කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පවත්වන දින පෙ. ව. 8.00 සිට 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදල් වලින් ගෙවිය යුතු අතර, චෙක්පත භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකු ම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිලදී ගන්නා සියලුම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

07. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් COVID -19 වසංගතය සම්බන්ධයෙන් නිකුත් කර ඇති උපදෙස් මාලාව අනුව නිසි පරිදි මුඛ ආවරණ පැළඳ තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත රැගෙන එන ලෙස දන්වා සිටිමි.

නාමල් පෙරේරා,
අතිරේක දිසා විනිසුරු/අතිරේක මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
ගම්පොල.

2022 මැයි මස 09 වැනි දින,
ගම්පොල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**භාණ්ඩ උපලේඛනය**

| | *නඩු අංකය* | *පී. ආර්. අංකය* | *භාණ්ඩය* | *ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01. | B/796/20 | PR/173/20 | දියර ඉසින ප්ලාස්ටික් ටැංකිය | 01 |
| 02. | අංක රහිත | | තහඩු පෙට්ටි | 01 |
| 03. | අංක අපැහැදිලි | | සූට්කේස් පෙට්ටි | 01 |
| 04. | අංක රහිත | | උදලු | 02 |
| 05. | අංක රහිත | | ජංගම දුරකථන | 01 |
| 06. | අංක රහිත | | කම්බි කුඩා ප්‍රමාණයක් | |
| 07. | අංක රහිත | | යකඩ වැලි තාච්චි | 01 |
| 08. | අංක රහිත | | 1 1/2 වතුර වැල්ව් | 01 |
| 09. | අංක රහිත | | පිත්තල මීටර් සහිත ගෑස් වැල්ව් | 01 |
| 10. | අංක රහිත | | කොන්ඩි පට්ටම් දෙර ලොක් කැබැල්ල සහිත අගුල් ඉබ්බා | 02 |
| 11. | අංක රහිත | | පාන් තැටි | 01 |
| 12. | අංක රහිත | | ඇලුමිනියම් තැටි | 02 |
| 13. | අංක රහිත | | ඇලුමිනියම් පියන | 02 |
| 14. | අංක රහිත | | යකඩ හතරැස් බටය සහ යකඩ කම්බි කැබලි | 01 |
| 15. | අංක රහිත | | අබලන් විදුලි හොට් ප්ලේට් | 02 |
| 16. | අංක රහිත | | විදුලි පන්දම් | 01 |
| 17. | අංක රහිත | | බිඳී ඇති වාහන කණ්ණාඩි | 01 |
| 18. | අංක රහිත | | වාහන සංඥා ලාම්පු | 01 |
| 19. | අංක රහිත | | ස්පීකර් බෆල් | 02 |
| 20. | අංක රහිත | | විදුලි හෝල්ඩර් | 01 |
| | | | ප්ලාස්ටික් හැඩල් | 01 |
| 21. | අංක රහිත | | පාපැදි මඩ කවර | 01 |
| 22. | අංක රහිත | | විසි කැති | 01 |
| 23. | අංක රහිත | | විදුලි පන්දම් | 01 |
| 24. | අංක රහිත | | සවල් | 01 |
| 25. | අංක රහිත | | සවල් | 01 |
| 26. | අංක රහිත | | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 27. | අංක රහිත | | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 28. | අංක රහිත | | ඇලුමිනියම් කල | 01 |
| 29. | අංක රහිත | | ඇලුමිනියම් කැඩුණු කේතල් මූඩි | 01 |
| 30. | අංක රහිත | | පොරෝ | 01 |
| 31. | අංක රහිත | | ගෙවීගිය උදලු | 01 |
| 32. | අංක රහිත | | ප්ලාස්ටික් බාල්දි | 01 |
| 33. | අංක රහිත | | තහඩු බාල්දි | 01 |
| 34. | අංක රහිත | | ප්ලාස්ටික් බට කැබලි | 01 |

| | නඩු අංකය | පී. ආර්. අංකය | භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 35. | 9249 | PR/564 | ගෑස් සිලින්ඩර් | 01 |
| 36. | 9249 | PR/564 | ගෑස් ලිප් | 01 |
| 37. | අංක රහිත | | යකඩ පටි | 01 |
| 38. | අංක රහිත | | තරාදි පඩි | 03 |
| 39. | 17158/19 (B/9582/17) | PR/1186/17 | KENTON වර්ගයේ පාපැදිය | 01 |
| 40. | 24573/21(බී/1087/19) | PR/674/19 | SUZUKI වර්ගයේ WP BAZ 2085 අංක දරන යතුරු පැදිය කොටස් කර වෙන්දේසිය සඳහා | 01 |

05-146

---

සංශෝධනයයි

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පොතුවිල්**

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

2022.05.06 වැනි දින පළ වූ අංක 2279 දරන ගැසට් පත්‍රය මගින් 2022.05.14 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ ප්‍රසිද්ධ වෙන්දේසිය නොවැළැක්විය හැකි හේතුවක් මත පැවැත්වීමට නොහැකි විය.

එදින පැවැත්වීමට නියමිතව තිබූ ප්‍රසිද්ධ වෙන්දේසිය එළඹෙන 2022.05.28 වැනි දින පෙරවරු 9.30 ට පැවැත්වීමට නියමිතව ඇති බව දන්වා සිටිමි.

ඒ. සී. රිස්වාන්,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්.

2022 මැයි මස 17 වැනි දින,
පොතුවිල් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

05-165

---

# තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

කෝට්ටමුනේ TT-2 රා තැබෑරුම් රේන්ද විකිණීම

**2022 ජූලි 2023 ජුනි**

1982.08.20 වැනි දින පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝට්ටමුනේ රා තැබෑරුම් රේන්දය **2022 ජූලි මස 01 වැනි දින සිට 2023 ජුනි මස 30 වැනි දින** දක්වා රා විකිණීම පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී බාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා සහභාගී විය යුතුයි.

1. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් පන්සියයක (රු.500) මුදල මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් නමින් මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත සහ වටිනාකම් සහතිකය ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත්‍රය ලබා ගත හැක. ටෙන්ඩර් පත සමග රිසිට්පත අමුණා තිබිය යුතුයි. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2022.05.20 වැනි දින සිට 2022.05.30 වැනි දින පස්වරු 2.30 දක්වා පමණි.

2. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතිකය ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතුයි. මෙම වටිනාකම් සහතිකයේ මුල්පිටපත ටෙන්ඩර්පත්‍ර සමග අමුණා තිබිය යුතු අතර මෙම

වටිනාකම් සහතිකය සමග ඉඩම් රෙජිස්ට්‍රාර්තුමා විසින් ලබාදෙන ඉඩම් ලේඛන සටහන් ලසු පිටපත් අමුණා තිබිය යුතුයි. (මෙම ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පටන් ගත් දිනයෙන් පසුව ලබාගත යුතුයි.)

3. ටෙන්ඩර්පත ඉදිරිපත් කරනු ලබන ලිපි කවරය තුළ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල පිටපත් ලිපි කවරය තුළ බහා එම කවරය අලවා ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් ඉහත 2 වැනි සටහන අනුව ලේඛනය අමුණා නොමැති නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකර, ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍යනම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ දින සිට සති දෙකක් තුළ ඔබ ලබා ගත් ටෙන්ඩර් පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

6. තැබෑරුම් දැනට පවත්වන ස්ථානයේ දී ඉදිරි කාලයේ අඛණ්ඩව ලබා දීමට හැකි දැයි සහතික කළ නොහැක.

7. ලියාපදිංචි කළ පොල් හා තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම්, සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර, දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව හා රා තැබෑරුම් බදු ගෙවා පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතුයි.)

8. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

වී. වාසුදේවන්,
ප්‍රාදේශීය ලේකම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මන්මුනේ උතුර, මඩකලපුව.

*උපලේඛනය*

| *රා තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* |
|---|---|---|
| මඩකලපුව මහනගර සභා මායිම් තුළ | TT2 | 2022.05.30 දින පස්වරු 2.30 |

***සටහන.-***

01. ටෙන්ඩර් මණ්ඩලය 2022.05.30 වන දින පස්වරු 2.30 ට රැස්වේ.

02. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2022.06.06 වැනි දින පස්වරු 2.30 ට සිදු කෙරේ.

05-169

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වේයන්ගොඩ, උතුවම්බෝගහවත්ත, අංක 98 දරන ස්ථානයෙහි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 945740337 V හිමි රතඹල අප්පුහාමිලාගේ උෂානි නිසංසලා කුමාරසිරි වන මම ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. ශිවන්තිකා සිරිවර්ධන මහත්මිය විසින් වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් මස 22 වැනි දින ලියා සහතික කරන ලද අංක 418 දරන ඇටර්නි බලපත්‍රය මගින් වේයන්ගොඩ, උතුවම්බෝගහවත්ත, අංක 98 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 911800306 V හිමි රතඹල අප්පුහාමිලාගේ අර්ජුන කුමාරසිරි යන අය වෙත පවරන ලද ඇටර්නි බලය 2022.05.12 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලංකාවාසී සියලුදෙනා හට මින් දැනුම් දෙමි.

රතඹල අප්පුහාමිලාගේ උෂානි නිසංසලා කුමාරසිරි.

05-135

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

No. 1176, SuttonCourt, Oshawa, Ontario, LIH8C7, Canada හි පදිංචි සෙල්ලපෙරුමගේ රංගනි සදිපිකා සන්තියාගෝ වන මා විසින් අංක 241/1 තලවතුගොඩ පාර, හෝකන්දර දකුණ, හෝකන්දර හි පදිංචි තොටවත්තේ දෙන් මැනුවෙල් ප්‍රසාද් ද සිල්වා වෙත ප්‍රදනය කරන ලද අනුශාන් අහංගම ටොරෝන්ටෝ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 2020 නොවැම්බර් මස 30 වැනි දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රය 2022 අප්‍රේල් මස 30 වැනි දින සිට අවලංගු වී අහෝසි වන අතර එය බලපැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

සෙල්ලපෙරුමගේ රංගනී සදිපිකා සන්තියාගෝ.

05-142

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

රුවන්වැල්ල, තැපැල් කහටගස්තැන්න, රෝහණමාලි යන ලිපිනයේ පදිංචි පරණතලගේ ප්‍රේමචන්ද්‍ර වන මා විසින් මහගිරිල්ල, උඩගිරිල්ල හි පදිංචි අතපත්තු මුදියන්සේලාගේ සමන් තිලකරත්න යන අයට ලබා දී ඇති ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. එච්. පී. බී. තෙන්නකෝන් මහතා විසින් ලියා සහතික කළ අංක 21637 සහ 2020.06.23 දිනැති ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බලරහිත කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

පරණතලගේ ප්‍රේමචන්ද්‍ර.

05-143

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ආර්. එම්. ඒ. එස්. ආර්. කේ. රත්නායක.
ගිණුම් අංක : 1063 5494 6874.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.09.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි අසූ පන් ලක්ෂ තුන් දහස් දෙසිය පනස් හතයි ශත දහ හතරක (රු. 18,503,257.14) මුදලද, 2020 අගෝස්තු 28 දින සිට අංක 3741 දරන උකස් බැඳුම්කරය මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි හැට තුන් ලක්ෂ තිස් දහසක (රු. 16,330,000/-) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොලියද දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.29 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.10.19 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2022.06.17 වැනි දින ප. ව. 1.30 ට** පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කුමාරගේවත්ත ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ තලංගම ග්‍රාමයේ පිහිටි ලේක් පාර වරිපනම් අංක 43/1 දරන ''දෙල්ගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම යන අය විසින් සාදන ලද 2017 සැප්තැම්බර් 28 දාතම හා අංක 6600 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඩයිනග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන දේපල සහ අංක 1278 දරන පිඹුරේ ලොට් 02 නැගෙනහිරට : අංක 1278 දරණ පිඹුරේ ලොට් 02 සහ පුද්ගලික පාර දකුණට :

පුද්ගලික පාර, අංක 1278 දරන පිඹුරේ ලොට් 09 සහ එෆ් ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන දේපල බස්නාහිරට : එෆ් ප්‍රනාන්දු සහ ඩයිනග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන දේපල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහයි දශම බිංදුවයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 35.00) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 6600 දරණ එකී පිඹුරට අනුවය.

එකී ලොට් 1A පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කුමාරගේවත්ත ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ තලංගම ග්‍රාමයේ පිහිටි ලේක් පාර වරිපනම් අංක 43/1 දරන ''දෙල්ගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. හෙට්ටිගේ යන අය විසින් සාදන ලද 1991 අගෝස්තු 20 දාතම හා අංක 1278 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එච්. ජී. පීරිස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : මෙහි ලොට් 2 සහ 8, දකුණට : ලොට් 8 සහ (අඩි 20 පළල පාර) බස්නාහිරට : ලොට් 9 සහ ෆැන්සිනා ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහයි දශම බිංදුවයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 35.00) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 1278 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව B1093/63 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 1278 දරන එකී පිඹුරේ ලොට් 8 සහ 9 වශයෙන් ලකුණුකොට ඇති පාර සඳහා වෙන්කිරීම දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-136

---

**පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ **2022 ක් වූ ජුනි මස 10 වැනි දින පෙරවරු 9.30 ට** දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ පිටකෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිටකෝට්ටේ නැගෙනහිර අංක 522 A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිටකෝට්ටේ බැද්දගාන පිහිටි පිටකෝට්ටේ බැද්දගාන උතුර, දූව පාර වරිපනම් අංක 162/4 A, දැන් වරිපනම් අංක 162/3 දරන පෙළෙන්ගහ වත්ත නමැති බලයලයත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 1994.03.14 දිනැති අංක 1654 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 දරන ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි සහ සියලු දෙය වේ.

විශාලත්වය පර්. 29.5

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. සූරියාරච්චි විසින් සහතික කරන ලද වර්ෂ 2016.03.16 දිනැති අංක 699 දරන ප්‍රාථමික උකස්කරය හා 2017.06.13 දිනැති අංක 1002 දරන ද්විතීයික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම ජයන්තා වික්‍රමසිංහ ගුණසේකර විසින් ''බන්ධනදයි/උකස්කරු'' ලෙස පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2018.09.28 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය*ද, එම දිනැති දිවයින, තිනක්කුරල්, සහ දි අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - පිටකෝට්ටේ සිට කෝට්ටේ පාර ඔස්සේ ඇතුල් කෝට්ටේ දක්වා මීටර් 750 ක් බංගලා හන්දිය දක්වා ගමන් කොට දකුණට ඇති බැද්දගාන පාරේ මීටර් 400 ක් ගමන් කළ යුතු ය. එතැනින් වමට ඇති බැද්දගාන උතුර පාරේ මීටර් 300ක් පමණ ගොස් දකුණට හැරී දේපළ දක්වා ඇති පාරේ මීටර් 100 පමණ ගමන් කළ විට දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැනුම් මුදලෙන් 10%ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් , (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙක හමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 7,000).

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90%ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90%ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු සඳහා කළමණාකරු, ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4667227

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011- 3068185, 071 4177199.

05-130

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ **වර්ෂ 2022 ක් වූ ජුනි මස 16 වැනි දින පෙරවරු 10.00 ට** පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

විශාලත්වය : පර්. 13

බස්නාහිර පළාතේ, (ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, ගම්පහ නගර සභා සීමාවේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, අංක 235, ඕරුතොට දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඕරුතොට ග්‍රාමයේ පිහිටි වරිපනම් අංක 0614, ඕරුතොට පිහිටි ''දලුක්ගහලන්ද'' යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිණි විසින් මැන සාදන ලද වර්ෂ 1998.09.30 දිනැති අංක 2063 දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු සී. එල්. වික්‍රමනායක විසින් මැන සාදන ලද වර්ෂ 1968. 01.06 දිනැති අංක 1/68 දරන පිඹුරෙහි ලොට් 1 හි උප බෙදීමක් වන) ''ලොට්'' දරන ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද වේ.

ලියාපදිංචි අංක පීකිව් 48 දරන පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. නමින්, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. ටී. විජේසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2018.06.26 වැනි දිනැති අංක 378 දරන ප්‍රාථමික චල උකස්කරය සහ වර්ෂ 2019.06.27 වැනි දිනැති අංක 600 දරන ද්විතියක උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පල්ලේවත්ත ගමරාලලාගේ සරත් සිසිර කුමාර සහ රාජපක්ෂ ආරච්චිගේ කුමුදුනී රාජපක්ෂ යන අය ''බන්ධනදයින්'' සහ පල්ලේවත්ත ගමරාලලාගේ සරත් සිසිර කුමාර යන අය ''උකස්කරු'' වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2022.04.08 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය*ද, දිවයින, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ඉහත කී දේපළට පිවිසෙන මාර්ගය.* - ගම්පහ පැන් ඒෂියා බැංකුවේ සිට ඕරුතොට පාර දිගේ කිලෝමීටර් 2ක් පමණ යන විට වමට ඇති විතාන මාවතට හැරුණු විට විෂය ගත දේපළ දකුණු පැත්තට මුහුණ ලා පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැනුම් මුදලෙන් 10%ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් , (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් ගැණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙක හමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,500)
(6) ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තු වශයෙන් රු. 1,500 ක් සහ මෙම විකිණීම සඳහා වන වෙනත් ඕනෑම ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිළේ පරිශේෂය වන 90%ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. නියම කොට හා ගිවිසගෙන ඇති පරිදි එකී මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියකියවිලි පරීක්ෂා කිරීම සහ ලබාගැනීම සඳහා කළමණාකරු ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011 4667227/011 4667230.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

එල්. බී. සේනානායක,
තක්සේරුකරු, බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

අංක. 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 011- 2445393-077 3242594.

05-131

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**පාමන්කඩ හැම්ඩන් පටුමගේ වරිපනම් අංක 23 8/2 දරන ස්ථානයේ පිහිටි අගනා සහාධිපත්‍ය මහල් නිවාසයක් වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ මහා නගර සභා පරිපාලන සීමාවේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර පාමන්කඩ ග්‍රාම නිලධාරි වසමේ පාමන්කඩ කොට්ඨාස අංක 46 හි හැම්ඩන් පටුමගේ පිහිටා ඇති බලයලත් මිනින්දෝරු කේ. කනගලිංගම් විසින් 2018 අගෝස්තු මස 06 වැනි දින මැන සකස් කරන ලද අංක 5488 දරන සහාධිපත්‍ය පිඹුරේ සඳහන් සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ 8 වන මහලේ පිහිටි EGB 23 8/2 දරන සහාධිපත්‍ය මහල් නිවස.

ප්‍රසිද්ධ නොතාරිස් සරෝජිනී මුදලිගේ විසින් 2019 මැයි මස 17 වැනි දින සහතික කරන ලද අංක 3595 දරන DFCC Bank PLC (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද බැඳුම්කරය මත අයවිය යුතු මුදල ගෙවීමට චන්ද්‍රසේකරම් විශාහන් ණයකරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරණ ලද බලය මත

(විසිතුරු හා කෑම කාමරයකින් ද, ප්‍රධාන නිදන කාමරයකින් ද, නිදන කාමර දෙකකින් ද, මුළුතැන් ගෙයකින් ද, නාන කාමර දෙකකින් ද හා සඳළුතලයකින් ද සමන්විත) වර්ග මීටර් 105.45 (වර්ග අඩි 1135) විශාලැති සහාධිපත්‍ය මහල් නිවාස පොදු පහසුකම් ආදී සියළු දේ සමඟ

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 වසංගතය සම්බන්ධයෙන් නිකුත් කරන ලද නිශ්චිත නිර්නායක අනුගමනය කරමින් මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.

**2022 ක් වූ ජුනි මස 17 වැනි දින පෙ. ව. 10.30 ට** දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2020.07.10 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2020.06.25 වැනි දින දිනපතා ''දිවයින'', ''දි අයිලන්ඩ්'' පුවත්පත් සහ 2020.06.29 වැනි දින ''තිනකුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය.-* කොළඹ කොටුවේ සිට කොළඹ හම්බන්තොට වැල්ලවාය A 2 ප්‍රධාන මාර්ගය ඔස්සේ වැල්ලවත්ත මංසන්දිය දක්වා කි. මී. 7ක් පමණ ගමන් කර වමට ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත හමුවේ. ඩබ්ලිව්. ඒ. සිල්වා මාවතේ දකුණට පිහිටා ඇති 3 වන පාර හැම්ප්ඩන් ලේන් වේ. මෙම පාරේ මීටර් 100ක් පමණ දුරකින් වම් පසින් ''හැම්ප්ඩන් රෙසිඩන්සිස්'' නමැති සහාධිපත්‍ය මහල් නිවාස ගොඩනැගිල්ල හමුවේ. අදාළ දේපළ මෙම ගොඩනැගිල්ලේ 8 වන මහලේ පිහිටා ඇත. වැල්ලවත්ත මංසන්ධියට කි. මී. 0.5 ක පමණ දුරකින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද ඒ මත ගෙවිය යුතු බදු ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ.

ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද ගෙවිය යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ ඩී. රාමනායක මාවතේ අංක 73, DFCC බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකරු, ණය පුනරුත්ථාපන සහ අයිකිරීම් ගෙන් විමසන්න. දුරකතන අංක 011- 2371371

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකතන අංක : 2873656, 0777 672082 ෆැක්ස් අංකය :2871184.

05-133

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**හම්බන්තොට බන්ධනාගාර වීදියේ වරිපනම් අංක 30 දරන ස්ථානය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ හම්බන්තොට මහා නගර සභා සහ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර හම්බන්තොට ග්‍රාම නිළධාරි වසමේ හම්බන්තොට කොට්ඨාස අංක 3 හි අලුත් වීදියේ පිහිටි බන්ධනාගාර වීදියේ වරිපනම් අංක 30 දරන පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු එයි කොටම්ඹගේ විසින් 2006 සැප්තැම්බර් මස 20 වැනි දින මැන සකස් කරන ලද අංක 4427 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන පරිශ්‍රය

ප්‍රසිද්ධ නොතාරිස් ටී. තරංගා රාමඩු විසින් 2019 මැයි මස 27 වැනි දින සහතික කරන ලද අංක 712 දරන DFCC Bank PLC නමට ලියන ලද බැඳුම්කරය මත අයවිය යුතු මුදල ගෙවීමට අබ්දුර් රහුමාන් මොහමඩ් සිල්මී ණයකරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරණ ලද බලය මත අ. 0, රූ. 0, පර්. 7.67

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් "COVID -19" වසංගතය සම්බන්ධයෙන් නිකුත් කරන ලද නිශ්චිත නිර්නායක අනුගමනය කරමින් මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.

**2022 ක් වූ ජුනි මස 10 වැනි දින පෙ. ව. 11.30 ට** දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2021.02.25 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2021.02.09 වැනි දින දිනපතා ''දිවයින'', ''දි අයිලන්ඩ්'' පුවත්පත් සහ 2021.02.10 වැනි දින ''තිනක්කුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය.-* හම්බන්තොට බස් නැවතුම් පොළ අසළ සිට බන්ධනාගාර වීදිය ඔස්සේ රෝහල මංසන්දිය දක්වා ගමන් කර ඉදිරියට යාර කිහිපයක් ගමන් කිරීමෙන් පාරට මුහුණ ලා පිහිටි මෙම දේපළට ළඟාවිය හැකි ය.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදු ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ.

ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියන් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද ගෙවිය යුතුයි.

වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ ඩී. රාමනායක මාවතේ අංක 73, DFCC බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකරු, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකතන අංක : 011- 2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකතන අංක : 2873656, 0777 672082 ෆැක්ස් අංකය :2871184.

05-134

---

## සෙලාන් බැංකුව පීඑල්සී - හොරණ ශාඛාව

වෙන්දේසි දැන්වීම අවලංගු කිරීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන පනතේ) 9 වන වගන්තිය යටතේ 2022 අප්‍රේල් මස 22 වැනි දින අංක 2277 දරන රජයේ *ගැසට් පත්‍රයේ* සෙලාන් බැංකුව පීඑල්සී හොරණ ශාඛාව යටතේ පළ වූ 04- 580 වෙන්දේසි කිරීමේ දැන්වීම මෙයින් අවලංගු කරන අතර ඒ අනුව එහි සඳහන් වූ පරිදි 2022 මැයි මස 16 වැනි දින එකී වෙන්දේසිය නොපැවත් වූ බව දැනුම් දෙනු ලැබේ.

තුසිත් කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච් ඔක්ෂන්,
අංක : 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011- 3068185, 011- 2572940.

05-138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.